# ගෙවත්ත

ඉතා යෝග්‍ය වේ. පැල සිටුවීමෙන් පසුව හොඳින් ජලය සපයන්න. මුල් අවධියේ දිනකට වරක් හෝ දෙවරක් දේශගුණ තත්වය අනුව ජලය සැප යීම ඉතා වැදගත්ය.

ආවරණය:

පොලිතින් බඳුන්වල සිටුවන ලද කෝපි පැල තද හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අඩි 10 පමණ උස් පියස්සක් තනා ඒ මත පැලලි හෝ පොල්අතු සෙවිලි කරන්න.

පැල තවාන නඩත්තු කිරීම:

කෝපි පැල කුඩා අවධියේ හොඳින් ජලය සැපයීමත් හිරුඑළිය මඳ වශයෙන් ලබාදීමත් අවශ්‍ය වෙ. පැල මෝරන අවස්ථාව එළඹීවිට ක්‍රමයෙන් ජලය සැපයීම අඩුකොට දින 2 ට වරක් පමණ ජලය දැමීම සෑහේ. සෙවන ද ක්‍රමයෙන් අඩු කරන්න. පැල සිටුවීමට හෝ අලෙවි කිරීමට අදහස් කරන දිනට මසකට පමණ කලින් සෙවන සම්පූර්ණයෙන් ම ඉවත් කොට පැල හොඳින් ඔරොත්තු දීමේ ශක්තිය ඇතිවන සේ පුහුණු කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතුයි. බොහෝ තවාන්වල කෝපි පැල කහ පැහැති වීම නිතර දක්නට ලැබෙන්නකි. මෙය ඇති වන්නේ හිරු එළිය තදින් වැටීමෙන් හෝ නයිට්‍රජන් ඌන තාවය නිසාය. යූරියා අවුන්ස 1 ක් වතුර ගැලොම් 2 ක මිශ්‍රකර ඉසීමෙන් පැල නැවතත් යථා තත්වයට පත් වේ.

රෝග හා පලිබෝධකයෝ:

දිලීර රෝග හා සුළු වශයෙන් කොළ කන දළඹුවන් ආදීන්ගෙන් ද පැල තවාන්වලට තරමක් හානි සිදු වෙ.

තඹ අඩංගු දිලීර නාශකය ඉසීමෙන් මල කඩ රෝගය වැනි දිලීර රෝග මර්ධනය කළ හැකිය.

## කරාබු

කරාබු තවාන් ඇරඹීම සඳහා අවශ්‍ය බීජ ලබා ගැනීමට සුදුසු තත්වයේ මව් ගස් තෝරා ගත යුතුය. නොකඩවා වර්ෂ කීපයක් අධික පලදාවක් ලබා දෙන වඩා උස් නොවූ මධ්‍යස්ථ ප්‍රමාණයේ තදකොළ පැහැති කොලදාවක් තිබෙන නිරෝගී ගස් මව් ගස් වශයෙන් වෙන්කර ගත යුතුය. මල් පිපීමෙන් පසුව ඒවා කඩා ගැනීමේ දී පෙර සඳහන් කළ ආකාරයේ තෝරාගත් මව් ගස්වල තවාන් කිරීමට අවශ්‍ය බීජවලට සෑහෙන ප්‍රමාණයට මල් ඉතිරි කර ගත යුතුය. මෙසේ ඉතිරිකර ගත් මල් වලින් හටගන්නා බීජ තවාන් කිරීම සඳහා ගත යුත්තේ හොඳින් ඉදුනු පසු බිම වැටෙන ඒවා පමණය.

පැල කිරීමට ගන්නා කරාබු බීජවල පහත සඳහන් ලක්ෂණයන් තිබීම ඉතා වැදගත් කොට සැලකේ:—

1. රත් පැහැති නොවූ කොළ පැහැයට හුරු අම්පාට ගෙඩි වීම.



පැල තවානක්

2. රාත්තලකට බීජ 500 කට වඩා අඩුව තිබීම.

3. කෘමි හානියකින් තොරව තිබීම.

4. ගෙඩියේ එක බීජයක් පමණක් තිබීම.

**බීජ පිළියෙල කර ගැනීම:**

ඉහත සඳහන් ලක්ෂණයන්ගෙන් යුත් බීජ තෝරා ගැනීමෙන් පසුව දින 3 ක් පමණ ජලයේ බහා තැබීමෙන් පිටපොත්ත පහසුවෙන් ගැලවී යයි. ඉන් පසුව සිටුවීම සඳහා සම්පූර්ණ වූ හොඳ බීජ පමණක් වෙන්කර ගත යුතුය.

**තවාන් කිරීම:**

ඉතාමත්ම පහසු ක්‍රමය වන්නේ ''8 × 10'' ගේජ් 300 පොලිතීන් බඳුන්වල ඇට තවාන් කිරීමයි. පොලිතීන් බඳුන් පිරවීම සඳහා කැලෑ පස් හෝ ගෙවතු පස් 1/3 කොටසක් ද, ගංගා වැලි 1/3 කොටසක් ද, කොම්පෝස්ට් හෝ හොඳින් දිරූ ගොම පෝර 1/3 කොටසක් ද මිශ්‍රකොට පස් මිශ්‍රණය පිළියෙලකර ගත යුතුය. මෙම මිශ්‍රණයෙන් පිරවූ පොලිතීන් බඳුනකට එක බීජය බැගින් අඟල් 1/2 ක් පමණ ගැඹුරින් සිටුවන්න. පොලිතීන් බඳුන් වල වැඩි ජලය වැස්සීම සඳහා සිදුරු කීපයක් ඇති කිරීම ඉතාමත් අවශ්‍ය වේ. බීජ සිටුවන ලද පොලිතීන් මලු ලං ලං ව තබා මඳ වශයෙන් සෙවන කරන්න. මාස 2 දී බීජ ප්‍රරෝහනය වේ.

**තවාන් පාලනය:**

මෙසේ මාස 6ක් පමණ සෙවනේ තබා පැල හොඳින් වැඩුණු පසු එම පැල සඳහා සපයා ඇති සෙවනත් ක්‍රමයෙන් අඩුකොට ජලය සැපයීමත් අඩුකළ විට පැල හිරු එළියට ඔරොත්තු දෙන ශක්තියක් ඇති වේ.මෙසේ තවාන් කල පැල මාස 8 සිට 12 දක්වා තවානේ තබාගත හැක. කරාබු පැල මුල් අවධියේ වැඩීම සිදුවන්නේ ඉතා සෙමින් බැවින් මසකට වරක් හෝ දෙවරක් නයිට්‍රජන් අඩංගු යූරියා පොහොර අවුන්සයක් වතුර ගැලොම් 2 මිශ්‍රකර ඉසීමෙන් නිරෝගී ශක්තිමත් පැල ඇති කර ගැනීමට හැකි වේ.

(ගොවිකම් සහරාව ඇසුරිණි)